# ධීවර අමාත්‍යාංශය

## ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය

## (නාරා ආයතනය)

## අභිලාෂය ප්‍රකාශ කිරීම (EOI)

## ශ්‍රී ලංකාව තුල සාගර මුතු වගාව ස්ථාපිත කිරීමේ නියමු පර්යේෂණාත්මක වැඩසටහන ක්‍රියාත්මක කිරීම

**කොන්ත්‍රාත් අංක :P&S/IARAD/2022/121/RL**

ශ්‍රී ලංකාවේ වෙරළාසන්නව ජීවත් වන ජනතාවගේ ආර්ථිකය සංවර්ධනය කිරීම සඳහා දිගු කලක් භාවිතා නොවූ සජීවී සම්පතක් වන සාගර මුතු කර්මාන්තය නැවත පිහිටුවීම සඳහා අවශ්‍ය පර්යේෂණ, සංවර්ධනය සහ අවශ්‍ය තාක්‍ෂණය ලබා දීමට ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා ආයතනය) සැලසුම් කොට ඇත. මේ සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා ආයතනය) විසින් සුදුසුකම් ලත් සැපයුම්කරුවන්ගෙන් සේවා ලබා ගැනීම සඳහා අභිලාෂයන් (EOI) කැඳවනු ලැබේ.

අපනයන ක්ෂේත්‍රයේ විභවයක් සහිත සංවර්ධනයක් සඳහා ඉහළ ගුණාත්මයෙන් යුත් මුතු නිෂ්පාදනයක් සහතික කිරීම අවශ්‍ය වේ.

මෙම කර්මාන්තය ස්ථාපිත කිරීමට පෙර, පර්යේෂණ සහ සංවර්ධන වැඩසටනක් සම්පූර්ණ කළ යුතු අතර, නියමු ආර්ථික ශක්‍යතා අධ්‍යන ආකෘතියක් මගින් පරීක්‍ෂා කළ යුතුය.

සැපයුම්කරුවන්ගෙන් පහත සඳහන් සේවාවන් අපේක්ෂා කෙරේ:

1. **පර්යේෂණ ආරම්භ කිරීම:** :නාරා ආයතනයේ විශේෂඥ දැනුම භාවිතා කරමින් සිදුකරනු ලබන පර්යේෂණ කටයුතු වලදී, සේවා සපයන්නා විසින් මුතු බෙල්ලන්ගේ ප්‍රශස්ත වර්ධනය සහ පැවැත්ම සඳහා අවශ්‍ය වන වගා කිරීම් සහ නඩත්තු කිරීම සඳහා අදාල විශේෂඥ ජාලයන් සහ පර්යේෂණාත්මක තොරතුරු සහ මූලාශ්‍ර ලබා ගැනීම සඳහා සහාය විය යුතු අතර ඒ සඳහා අවශ්‍ය වන සියළු වියදම් දැරීම සිදු කළ යුතුය.
2. **පුහුණුව** : සේවා සපයන්නා විසින් මුතු න්‍යෂ්ඨිකරන තාක්‍ෂණය සහ පිරිපහදු කිරීම සහ අණුක තාක්‍ෂණය භාවිතා කරමින් ගුණාත්මකව මුතු වර්ධනය කිරීම සඳහා නාරා ආයතනයේ විද්‍යාඥයින් පුහුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

3. **ශක්‍යතා අධ්‍යනය සහ ආර්ථික අධ්‍යනය (වෙනත්)** :සේවා සපයන්නා විසින් දත්ත මත පදනම් ව ශක්‍යතා සහ ආර්ථික ආකෘති සංවර්ධනය කර, නියමු ව්‍යාපෘතින් සඳහා විකල්ප නිර්දේශ කල යුතුය.
4. **අධ්‍යාපනය** :දේශීය විශ්ව විද්‍යාලයක MPhil හෝ PhD සඳහා ලියාපදිංචි වූ පශ්චාත් උපාධි සිසුන් එකක් හෝ දෙදෙනෙකු සඳහා සේවා සපයන්නා විසින් නාරා ආයතනයට සහාය විය යුතු අතර එම අධ්‍යනයන් සඳහා මග පෙන්වීම සහ අධීක්ෂණය ලබා දිය යුතුය.
5. **ක්‍රියාත්මක කිරීම :** සේවා සපයන්නා විසින් ප්‍රජා සංවර්ධන ක්‍රියාකාරකම් සහ ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ ආර්ථික දියුණුව සහතික කරන ද්විතියික කර්මාන්ත ප්‍රවර්ධනය ඇතුළු සම්පත් ප්‍රවර්ධනය සහ අලෙවිකරණ ක්‍රියාකාරකම් සිදු කල යුතුය.
6. **ආදායම හුවමාරු කරගැනීම :** පර්යේෂණයෙන් පසු වගා වැඩසටහන සිදු කරන විට, එහි පර්යේෂණ වැඩිදියුණු කිරීම සඳහා ඉපැයීම්වලින් ප්‍රතිශතයක් නාරා ආයතනය වෙත ලබා දිය යුතුය. තාක්ෂණික යෝජනාව සමඟ ඉදිරිපත් කිරීමට නියමිත මූල්‍ය යෝජනාවේ මෙම ප්‍රතිශතය දැක්විය යුතුය.
7. **ප්‍රජා සංවර්ධනය :** මෙම සහයෝගිතාවය/නියැලීම සම්බන්ධයෙන්,සේවා සපයනු ලබන සමාගම සහ නාරා ආයතනය අතර,අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක පුද්ගලික පොදු හවුල්කාරිත්ව ගිවිසුමක් (PPP) අත්සන් කළ යුතුය.

මෙවැනි ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කිරීම පිලිබඳ තහවුරු කළ වාර්තාවක් ඇති සංවිධානවලට,පහත සඳහන් ලේඛන ද ඇතුළුව ඔවුන්ගේ අභිලාෂයන් ප්‍රකාශ කිරීම (EOI) සඳහා ආරාධනා කෙරේ.

1. නම, ලිපිනය සහ නෛතික තත්වය
2. ඉහත ව්‍යාපෘතියේ විෂයපථය මත පදනම් වූ මූලික විසඳුම් යෝජනාව.
3. සංවිධානය සමුද්‍ර මුතු නිෂ්පාදකයකු නොවන බව සහතික කරන ස්වයං ප්‍රකාශය.
4. ශක්‍යතා අධ්‍යන සහ ව්‍යාපාර සංවර්ධන ක්‍රියාකාරකම් සංවර්ධනයට සහායවීමේ හැකියාව ඇති පර්යේෂණ සහ සංවර්ධන, විද්‍යාත්මක ජාල සහ නීති විශේෂඥතාව පිළිබඳ වසර තුනක (03) පළපුරුද්ද සහතික කරන ආධාරක සාක්ෂි සහිත ස්වයං ප්‍රකාශය.
5. සමාගම සංස්ථාගතකිරීම, පාලනය පිළිබඳ විස්තර, මූල්‍ය අඛණ්ඩතාව සහ ලේඛණ කළමණාකරන පද්ධති පිලිබඳ සහතික කළ පිටපත්.

මේ සඳහා උනන්දුවක් දක්වන, සුදුසුකම්ලත් ආයතන නියෝජිතයන් හට තම අභිලාෂය 2023 ජනවාරි 05 දින සිට 2023 පෙබරවාරි 03 දක්වා (සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 02.00 දක්වා) සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය

(නාරා ආයතනය), කාක දූපත, මට්ටක්කුලිය, කොළඹ 15 යන ලිපිනයට තැපැල් කර හෝ ගෙනැවිත් භාරදිය හැක. (ටෙන්ඩර් පෙට්ටි අංක 01, මුදල් අංශය). ලිපි කවරයේ ඉහළ වම්පස කෙළවරෙහි " ශ්‍රී ලංකාව තුල සාගර මුතු වගාව ස්ථාපිත කිරීමේ නියමු පර්යේෂණාත්මක වැඩසටහන ක්‍රියාත්මක කිරීම" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

මෙම ව්‍යාපෘතිය සඳහා ඉදිරිපත් වන අභිලාෂයන් විධිමත් ඇගයීමකින් පසු වඩාත් සුදුසු ව්‍යවසායකයින්ගෙන් නාරා ආයතනය විසින් නිකුත් කරනු ලබන කාර්යය පැවරුම් සංග්‍රහය (TOR) අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික සහ මූල්‍ය යෝජනා (RFP) කැඳවනු ඇත. තාක්ෂණික සහ මූල්‍ය යෝජනා වෙන් වෙන් වශයෙන් ඇගයීමෙන් පසු සුදුසු ව්‍යවසායකයකු තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

වැඩි විස්තර සඳහා ආචාර්ය පී.පී.එම්.හීනටිගල මිය, අංශ ප්‍රධානි, අභ්‍යන්තර ජලජීවී වගා අංශය (IARAD), නාරා ආයතනය (දු.ක. 011 2521005 ; ජංගම. 071 8569783; විද්‍යුත් තැපෑල. prajani15@hotmail.com) අමතා ලබාගත හැක.


සභාපති,

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,

නාරා ආයතනය,

කාක දූපත,

මට්ටක්කුලිය,

කොළඹ 15

දු.ක: 011-2521717

ෆැක්ස් : 0112-521932

විද්‍යුත් තැපෑල: purchasingp@nara.ac.lk